දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු
First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

දේවිප්‍ර 1.2 - ක්‍රි.ව. 1832 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය
PS 1.2 – Government and Politics of Sri Lanka Since 1832

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. 1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගින් මෙරට ඇතිකරන ලද ප්‍රධාන සමාජ, ආර්ථික හා දේශපාලන වෙනස්කම් විවේචනාත්මකව විග්‍රහ කරන්න.

02. "ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ පදනම ද, අරමුණු ද පටුය. එහෙයින් එහි ප්‍රතිඵල ද සීමා සහිත විය" විභාග කරන්න.

03. ශ්‍රී ලංකාවේ දේශපාලන වර්ධනය කෙරෙහි 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

04. "1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ශ්‍රී ලංකාවට ප්‍රධානය කළේ පූර්ණ වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් නොව, සීමිත වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයකි" සාකච්ඡා කරන්න.

05. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් නවාංග මොනවා ද? ඒවා කොතරම්දුරට සාර්ථක පාලනයකට ඉවහල් වී ද? විමසන්න.

06. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව හඳුන්වාදුන් යුගයේ සිටම අද දක්වාම නිතර විවේචනයන්ට භාජනය වන ප්‍රධාන ව්‍යුහාත්මක ලක්ෂණ මොනවා ද? පරීක්ෂා කරන්න.

07. "ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ වාමාංශික ව්‍යාපාරය වැදගත් කාර්ය භාරයක් ඉටු කළත්, නව වාමාංශික ප්‍රවනතාවයන්හි වැදගත්කම හීනවී ඇත." විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

08. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ ආගමික සාධකයේ භූමිකාව ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?

09. "ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ උපත, සංවිධානය, ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සංවිධානය වූ දේශපාලන පක්ෂ ක්‍රමයකට වඩා පුද්ගල බද්ධ ක්‍රියාමාර්ගවලට අනුව හැඩගැසී පවතී" ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

10. පහත සඳහන් මාතෘකා <u>දෙකක්</u> (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියෙහි මෑතකාලීන ප්‍රවනතා

II. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට එකතු කළ 19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

III. ශ්‍රී ලංකාවේ පාරිසරික අර්බුද හා දේශපාලන සම්බන්ධතා

IV. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිල විපක්ෂයේ භූමිකාව

********************************************